# දඹුල්ල රජමහා විහාරය ආශ්‍රිත කලාපයේ සංචාරක ප්‍රවර්ධනය කෙරෙහි බලපාන නූතන අභියෝග පිළිබඳ 'ශදුඅත' විශ්ලේෂණයක්

ඒ.එම්.යූ.ඒ. ඒකනායක[1]

ප්‍රමුඛ පදඃ සංචාරක ප්‍රවර්ධනය, ශදුඅත විශ්ලේෂණය, අභියෝග, බිතුසිතුවම්, ගැටලු

## හැඳින්වීම

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ වගපනහ පල්ලෙසිය පත්තු කෝරළයේ පිහිටා ඇති රංගිරි දඹුල්ල රජමහා විහාරය දේශීය හා විදේශීය සංචාරකයන්ගේ ආකර්ෂණයට ලක්වන ප්‍රසිද්ධ ස්ථානයකි. මෙම ස්ථානයේ ඇති බිතුසිතුවම් ශ්‍රී ලංකාවේ විශාලතම පුරාණ සිතුවම් එකතුව ලෙස සැලකේ. දඹුල්ල රජමහා විහාරය ක්‍රි.ව 1991 වර්ෂයේ දී ලෝක උරුමයක් ලෙස යුනෙස්කෝ සංවිධානය විසින් නම් කර ඇති අතර පළමු ලෝක උරුම නිර්ණායකය සහ හයවන ලෝක උරුම නිර්ණායකයන් මෙය ලෝක උරුමයක් ලෙස නම් කිරීම සඳහා ඉවහල් වී ඇත. ක්‍රි.පූ 104 –74 අතර කාලයේ ශ්‍රී ලංකාවේ රජ කළ වළගම්බා රජු විසින් මුලින්ම මෙම විහාරය ඉදිකරන ලදැයි සැලකේ (සෙනෙවිරත්න, 1995). පසුව මහනුවර යුගය දක්වාම මෙහි ප්‍රතිසංස්කරණ කටයුතු සහ නවාංග එකතු කිරීම විවිධ පාලකයන්ගේ අනුග්‍රහයෙන් සිදුවී ඇත. දඹුල්ල රජමහා විහාරය යුනෙස්කෝ ලෝක උරුමයක් වීමත්, මෙහි දක්නට ලැබෙන ඉපැරැණි බිතුසිතුවම් ආදියත්, ආගමික වැදගත්කමත් නිසා දේශීය මෙන්ම විදේශීය සංචාරක ආකර්ෂණයද නොමඳව ලැබෙන අතර ශ්‍රී ලංකාවේ වැදගත් සංචාරක ස්ථානයක් වශයෙන් හඳුනාගත හැකිය. ජාතික ආර්ථිකයට සංචාරක කර්මාන්තය ඔස්සේ සැලකිය යුතු විදේශ විනිමයක් ලබාදෙන ස්ථානයක් ලෙසද පෙන්වා දිය හැකිය. මෙම දඹුල්ල රජමහා විහාරය ආශ්‍රිත කලාපය තුළ සංචාරක ප්‍රවර්ධනය සඳහා පවතින නූතන අභියෝග ගණනාවක් හඳුනාගත හැකිය. ඒ අතරින් සංචාරක ප්‍රවර්ධන කටයුතු සඳහා රජයේ දායකත්වය අඩුවීම, ආගමික හා සංස්කෘතික වශයෙන් ඇතිවන ගැටලු, සමාජීය ගැටලු, සංචාරකයන් සඳහා පවතින සුහසාධන ගැටලු ආදි වශයෙන් නූතන අභියෝග රාශියක් හඳුනාගත හැකිය. දඹුල්ල රජමහා විහාරය ආශ්‍රිත කලාපයේ සංචාරක ප්‍රවර්ධනය කෙරෙහි බලපාන නූතන අභියෝග මොනවාද සහ ඒවාට ඵලදායී ලෙස මුහුණ දීම සඳහා යෝජනා කළ හැකි උපායමාර්ග මොනවාද යන්න මෙම පර්යේෂණයේ ගැටලුව වේ. දඹුල්ල රජමහා විහාරය ආශ්‍රිත කලාපයේ සංචාරක ප්‍රවර්ධනය කෙරෙහි බලපාන නූතන අභියෝග පිළිබඳව ශදුඅත විශ්ලේෂණයක් සිදු කිරීම මගින් අභ්‍යන්තර ශක්තීන්, දුර්වලතා

[1] පුරාවිද්‍යා හා උරුමකළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
udithaekanaya@gmail.com

සහ බාහිර අවස්ථා, තර්ජන හඳුනා ගැනීම සහ ආශ්‍රිත කලාපයේ සංචාරක ප්‍රවර්ධනය සඳහා උපායමාර්ගික නිර්දේශ ඉදිරිපත් කිරීම මෙම පර්යේෂණයේ අපේක්ෂිත අරමුණ වේ.

**ක්‍රමවේදය**

මෙම අධ්‍යයනය සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනය හා ක්ෂේත්‍ර නොවන අධ්‍යයන ක්‍රමවේදය උපයෝගී කරගන්නා ලදී. ක්ෂේත්‍ර නොවන අධ්‍යයන ක්‍රමවේදය යටතේ සංඛ්‍යා ලේඛන පරිශීලනයෙන් දත්ත ලබාගන්නා ලද අතර ක්ෂේත්‍ර අධ්‍යයන ක්‍රමවේදය ලෙස ක්ෂේත්‍ර නිරීක්ෂණ කරන ලද අතර දඹුල්ල රජමහා විහාරය නැරඹීමට පැමිණෙන සංචාරකයින් සමඟ මෙන්ම දඹුල්ල ආශ්‍රිතව ජීවත්වන තෝරාගත් පිරිස් සමඟ කණ්ඩායම් සාකච්ඡා, සම්මුඛ සාකච්ඡා වැනි පර්යේෂණ ක්‍රම මඟින් දත්ත එකතු කරන ලදී. ලබාගත් දත්ත අදාළ කාණ්ඩවලට වෙන් කරමින් දත්ත විශ්ලේෂණය හා ඉදිරිපත් කිරීම සිදුකරන ලදී. ඉන්පසු එම දත්ත අධ්‍යයනය කරමින් අවසාන වශයෙන් නිගමනවලට එළඹීමට කටයුතු කරන ලදී.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

දඹුල්ල රජමහා විහාරය ආශ්‍රිත සංචාරක කලාපය තුළ ඇති ශක්තීන්, අවස්ථා, දුර්වලතා සහ තර්ජන ආදිය හඳුනා ගනිමින් ශදුඅත විශ්ලේෂණයක් කළ හැකි අතර ඒ තුළින්ම මෙම ස්ථානයේ සංචාරක ප්‍රවර්ධනය සඳහා ඇති නූතන අභියෝග හඳුනාගත හැකිය. මෙම ස්ථානයේ පවතින දුර්වලතා සහ තර්ජන අභියෝග වශයෙන්ද ක්‍රියාත්මක වේ. ශදුඅත විශ්ලේෂණයේදී අවස්ථා සහ ශක්තීන්ද විශාල ප්‍රමාණයක් දඹුලු විහාරය ආශ්‍රිත කලාපය තුළින් හඳුනාගත හැකිය. ඒ අනුව දඹුල්ල නගරයේ මධ්‍යගත පිහිටීම, සංචාරක ආකර්ෂණය සහිත ස්ථාන විශාල ප්‍රමාණයකට මධ්‍යගතව පිහිටීම, ලෝකයේ බිතුසිතුවම් විශාල ප්‍රමාණයක් ඇති ස්ථානයක් වීම, අද්විතීය කලාත්මක සහ වාස්තු විද්‍යාත්මක ලක්ෂණ හඳුනාගත හැකි වීම, ආගමික වැදගත්කම, අනෙකුත් ප්‍රදේශවලට සාපේක්ෂව දඹුල්ල නගරයේ යටිතල පහසුකම් දියුණු වී තිබීමත් අවස්ථා සහ ශක්තීන් වශයෙන් හඳුනාගත හැකිය.

හඳුනාගත හැකි නූතන අභියෝග වන ආර්ථික, සමාජ හා සංස්කෘතික, ආගමික සහ පාරිසරික ගැටලු සඳහා යෝජනා ඉදිරිපත් කිරීමේදී කැලි කසළ ප්‍රශ්නය ප්‍රධාන අභියෝගයක් වන අතර විසඳුමක් ලෙස කැලි කසළ ප්‍රතිචක්‍රීකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදුකළ හැකිය. සංචාරකයන්ට උරුම ස්ථානය වෙත පහසුවෙන් ප්‍රවේශවීම සඳහා මාර්ග පහසුකම් ඇති කිරීම වැදගත් වේ. සනීපාරක්ෂක පහසුකම් වැඩි කිරීම සහ වර්තමානයට ගැලපෙන සුදුසු තත්ත්වයේ වැසිකිළි කැසිකිළි පහසුකම් ඇති කිරීමත් වැදගත් වේ. මෙම උරුම ස්ථානයට ගමන් කරන මාර්ගය දෙපස වෙළඳාම් කරන වෙළඳුන්ගෙන් ඇතිවන අවහිරතාවය අවම කිරීම සඳහා විධිමත් ප්‍රවේශ මාර්ගයක් නිර්මාණය කිරීමේ අවශ්‍යතාව පවතී. සංචාරක සේවා සහ පහසුකම් අඩු මට්ටමක පවතින නිසා ප්‍රමිතියෙන් යුතු

නවාතැන් පහසුකම් සහ ආපනශාලා ඇති කිරීමත්, සංචාරක තොරතුරු මධ්‍යස්ථාන පිහිටුවීමත්, බහුභාෂා මාර්ගෝපදේශකයන් පුහුණු කිරීමත් වැදගත් වේ. සංචාරකයන්ගේ ආරක්ෂාව සුරක්ෂිත කිරීම සඳහා සංචාරකයන්ට ඇතිවන ගැටලු විසඳීම සඳහා පැය 24 පුරා ක්‍රියාත්මක වන ක්ෂණික ඇමතුම් සේවාවක් ඇති කිරීමත් වැදගත් වේ.

දඹුල්ල රජමහා විහාරයට අමතරව සීගිරිය, ඉබ්බන්කටුව මෙගලිතික සුසාන භූමිය, කලා වැව වැනි අනෙකුත් ආකර්ෂණීය ස්ථාන ඇතුළත් සංචාරක පැකේජ ඇති කිරීමත්, සමාජ මාධ්‍ය හරහා ප්‍රචාරණයන් සිදු කිරීමත් පැමිණෙන සංචාරකයන් ප්‍රමාණය වැඩිකර ගැනීමට හේතුවේ.

### සමාලෝචනය

ඒ අනුව දඹුල්ල රජමහා විහාරය ආශ්‍රිත කලාපය තුළ සංචාරක ප්‍රවර්ධනය සඳහා අභියෝග ගණනාවක්ම හඳුනාගත හැකි අතර ශදුඅත විශ්ලේෂණයක් තුළින් එය වඩාත් පැහැදිලිව පෙන්වා දිය හැකිය. එසේම වර්තමානයේ සංචාරක ප්‍රවර්ධනය සඳහා පවතින අභියෝග ජයගැනීම උදෙසා විසඳුම් ඉදිරිපත් කිරීම ද වැදගත් වේ.

### ආශ්‍රිත මූලාශ්‍රය

ඉලංගසිංහ, මංගල. (1987). ***රංගිරි දඹුලු විහාරය.*** ගොඩගේ ප්‍රකාශකයෝ.

සිල්වා, සුරංග. (2011). ***සංචාරක සංවර්ධන ප්‍රවේශය.*** ගොඩගේ ප්‍රකාශකයෝ.

සෙනෙවිරත්න, අනුරුද්ධ. (1995). ***රංගිරි දඹුලු රජමහා විහාරය,*** මධ්‍යම සංස්කෘතික අරමුදල.

පතිරණ, යූ.පී.එස්. (2001). ***ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය,*** වරකාපොල ආරිය ප්‍රකාශකයෝ.